සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2018 ජූලි 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜீலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, July 2018**

බෞද්ධ ශිෂ්ටාචාරය
පිළිතුරු පත්‍රය
**Buddhist Civilization - Answer**

**45** **S** **I-II**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01 - 4 | 11 - 1 | 21 - 3 | 31 - 5 | 41 - 4 |
| 02 - 3 | 12 - 3 | 22 - 2 | 32 - 1 | 42 - 1 |
| 03 - 2 | 13 - 5 | 23 - 1 | 33 - 2 | 43 - 5 |
| 04 - 3 | 14 - 1 | 24 - 5 | 34 - 2 | 44 - 3 |
| 05 - 1 | 15 - 4 | 25 - 1 | 35 - 3 | 45 - 2 |
| 06 - 2 | 16 - 5 | 26 - 3 | 36 - 1 | 46 - 4 |
| 07 - 3 | 17 - 2 | 27 - 3 | 37 - 2 | 47 - 2 |
| 08 - 1 | 18 - 4 | 28 - 2 | 38 - 5 | 48 - 5 |
| 09 - 3 | 19 - 5 | 29 - 4 | 39 - 3 | 49 - 2 |
| 10 - 4 | 20 - 2 | 30 - 3 | 40 - 1 | 50 - 5 |

මුළු ලකුණු 2 × 50 = 100

## I කොටස

**(1), (2), (3) ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 4 බැගිනි. 5, 6, 7, 8 ප්‍රශ්නවල එක් කොටසකට ලකුණු 10 බැගිනි.**

01. (i) "පශුනං රක්ෂණං දාන - මිජ්‍යාධ්‍යයන මේවච
වණික්පථං කුසීදංච - වෛශ්‍යස්‍ය කෘෂිමේවච
(මනුඃ- 1 - 90)

පශු පාලනය, දන්දීම, වේද අධ්‍යයනය, යාග කිරීම, වෙළඳාම, මුදල් පොළියට දීම, කෘෂි කර්මාන්තය යන කරුණු වෛශ්‍ය වර්ණයට අයත් වූ ස්ව ධර්මයන්ය.

(ii) උපනයනය යනු මංගල අවස්ථාවකි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය යන කුල තුනෙහි පිරිමි දරුවන් පිළිවෙළින් වයස අවු. 10, 11, 12 යන කාලසීමාවන්හිදී මෙම අවස්ථාවට සම්බන්ධ කරයි. පූන නූල කර පැළඳීම මෙහිදී සිදු කරයි. බ්‍රාහ්මණ පූජකයකු විසින් සූර්ය දේවතාවා වෙනුවෙන් පුද පූජා තබා ගයත්‍රි ශ්ලෝක ගායනා කර මෙම කාර්ය සිදු කිරීමෙන් පසු එම කුමරුවා 'ද්විජ' තත්ත්වයට පත් වෙයි.

(iii) ඒ ඒ කුලවලට අයත් ස්වධර්මවල නිරත වීමට නොහැකි පොදු ආපදාපන්න (ජල ගැලීම්, ගිනිවිපත් ආදී) තතත්වයක් හෝ කිසියම් ශාරීරික ආපදාවන් ඇති වූ අවස්ථාවක් ආපදාපන්න අවස්ථාවකි. එහිදී තමාට නියමිත කාර්ය කිරීමට නොහැකිනම් තමාට වඩා පහළ කුලවලට අයත් ස්වධර්මයන් හි නියැලීමට මේ අනුව අවස්ථාව උදාවෙයි.
පහළ වර්ණයන්ට ඉහළවර්ණවල කටයුතු කළ නො හැකිය.

- බ්‍රාහ්මණයාට තමාට වඩා පහත් ශ්‍රේණි වූ ක්ෂත්‍රිය හා වෛශ්‍යයාට නියමිත ස්වධර්මවල නියැලීමට හැකිය.
- ක්ෂත්‍රියාට වෛශ්‍යයාගේ කටයුතුවල නිරත වීමට හැකිය.
- වෛශ්‍යයාට ශුද්‍රයාගේ කාර්යන්හි නිරතවිය හැකිය.
- ශුද්‍රයාට ආපද්ධර්ම යටතේ ද වාසියක් නොලැබුණේ මෙහි අවරෝහණ ප්‍රතිපදාව මිස ආරෝහණ ක්‍රියාවලියක් නොතිබූ බැවිනි.

(iv)
- දීඝ නිකායේ සාමඤ්ඤඵල සූත්‍රයට අනුව ඔහුගේ ඉගැන්වීම් කිහිපයකි.
- නියතිවාදය, සංසාර ශුද්ධිවාදය, අහේතුඅප්පච්චයවාදය, පරිනාම වාදය, දෛවවාදය
- සසර ගත සෑම පුද්ගලයෙක්ම අනිවාර්යයෙන් කල්ප 84000ක් වාසය කළ යුතුය.
- සත්ත්වයා විඳින දුක සැප සත්ත්වයාගේ කෙලෙසීම හා පාරිශුද්ධිය ආදිය ද හේතු ප්‍රත්‍යයකින් තොරව සිදු වන්නේය.
- බලය, පරාක්‍රමය, ශක්තිය නැති සත්ත්වයකු බැවින් මිනිසාට විමුක්තිය උදෙසා කළහැකි දෙයක් නොමැති බව පවසයි.
- කර්ම විපාක බැහැර කරන බැවින් අකිරියවාදියෙකි.

(v)
- අරහං බුදු ගුණය

සියලු කෙලෙස් දුරු කළ නිසාත් රහසින්වත් පව් නොකළ නිසාත් (නරහං යස්ස සො අරහං) සියලු පුද පූජාවන්ට සුදුසු නිසාත් බුදුරජාණන් වහන්සේ "අරහං" නමින් හඳුන්වනු ලබයි.

02. (i) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහරණ තුළින් පුද්ගලයාගේ අභ්‍යන්තර පාරිශුද්ධියත් ඒ හේතුවෙන් සමාජ සංවර්ධනයත් සිදුවන ආකාරය පැහැදිලි කිරීම ප්‍රමාණවත් වෙයි. සමාජ සහජීවනයට මේවා ඉවහල් වන අයුරු දක්විය යුතුය.

(ii) "සමජීවිකතාව" පුද්ගලයකුගේ මෙලොව දියුණුව සඳහා හේතුවන්නකි. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ මෙලොව දියුණුව සඳහා බලපාන කරුණු හතරක් උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා සමජීවිකතා යනුවෙන් දක්වයි.

"මේ ලෝකයේ කුල පුත්‍රයෙක් භෝගයන්ගේ වස්තූන්ගේ අය ද වැය ද දැන ඉතා වැඩිත් නොකොට අඩුත් නොකොට සමව දිවි ගෙවයි. මෙසේ මාගේ අය වැය ඉක්මවා සිටී. මෙසේ මාගේ වැය අය ඉක්මවා නොසිටී. යනුවෙන් ව්‍යග්ඝ පජ්ජ සූත්‍රයේ සමජීවිකතා විග්‍රහ කර ඇත. පමණ දැන වියදම් කිරීමෙන් සමව දිවි ගෙවීමට මෙයින් උපදෙස් දෙමි. තමාට ලැබෙන ආදායම දැනගෙන ඊට වඩා වැය නොකර එනම් අය අනුව වැය කර ජීවත්වීමෙන් පුද්ගල සංවර්ධනය සිදුකර ගත හැකිය.

(iii) සේව්‍යාගේ යුතුකම්:-

1. ශක්ති ප්‍රමාණයට වැඩ පැවරීම (යථා බලං කම්මන්ත සංවිධානේන)
2. ආහාරපාන හා වැටුප් නිසි පරිදි දීම (භත්තවෙතනානුප්පදානේන)
3. ගිලන් වූ විට සොයා බැලීම. (ගිලානුපට්ඨානේන)
4. මිහිරි රස ආහාර පාන ලද විට බෙදා දීම (අච්ඡරියානං රසානං සංවිභාගේන)
5. සුදුසු වේලාවට විවේක ලබාදීම (සමයෙවොස්සග්ගේන)

සේවකයාගේ යුතුකම්:-

1. ස්වාමියාට පළමුව නැගිටීම (පුබ්බුට්ඨායිනෝච)
2. ස්වාමියාට පසුව නිදා ගැනීම (පච්ඡානිපාතිනෝච)
3. දුන් දෙයපමණක් ගැනීම (දින්නාදායිනො)
4. මැනවින් නියමිත වැඩ කිරීම (සුකතකම්ම)
5. ස්වාමියාගේ ගුණ පැතිරවීම (කිත්තිවණ්ණහරා)

නම් කිරීම ප්‍රමාණවත්ය.

(iv) ● දානය, ප්‍රියවචන, අර්ථචර්යාව, සමානාත්මතාවය යනු සතර සංග්‍රහ වස්තුවයි.

● දානය යනු දීමයි දේශපාලන මූල ධර්මයක් ලෙස සැලකීමේ දී රටවැසියා විෂයෙහි නිස්සරණාධ්‍යාසයෙන් පරිත්‍යාගශීලීව ක්‍රියා කරමින් ආර්ථික තත්ත්වයන් හඳුනාගෙන ක්‍රියා කිරීමයි. රටවැසියාගේ ආර්ථික සංවර්ධනය සඳහා කටයුතු කිරීම මෙහි අදහසයි.

● ප්‍රිය වචනයෙන් කතා කිරීම නිලධාරියාගේ මෙන්ම සියලු දෙනාගේ ම ප්‍රසාදයට හේතුවෙයි.

● අර්ථචර්යාව යනු පාලකයා සියලු ජනතාවගේ යහපත, දියුණුව වෙනුවෙන් කටයුතු කිරීමයි.

● අටලෝ දහමින් කම්පා නොවන පාලකයා සිදු කරන්නේ ජනතා සේවයකි.

● උස් පහත් භේද නොසලකා පොදුවේ ජනතාව තම රට වැසියන්ගෙන් බව සමව සිතා කටයුතු කිරීම ද සමානාත්මතාවයයි. සමතත්ත්වයේ සිටින්නන්ට සමානව සැලකීම තුළින් ගැටලු අවම කර ගැනීමට ද හැකියාව ලැබේ.

(v) විශාඛා මහෝපාසිකාව

● ධනඤ්ජය සිටුතුමාගේ හා සුමනා දේවියගේ දියණියකි.

● බුදු බණ අසා සත් හැවිරිදි වියේදී සෝවාන් විය.

● මිගාර සිටුවරයාගේ පුත් පූර්ණවර්ධන කුමරු සමග විවාහ විය.

● ධනවත් කමත් ගුණවත්කමත් ඇය තුළ විය.

● භික්ෂූන්ට මෙන්ම භික්ෂුණීන්ට ද සිවුපසයෙන් උවටැන් කළේය. ඇතුළත ගිනි පිටත නොදෙන්න පිටත ගිනි ඇතුළට නොගන්න ආදී වශයෙන් කියා දුන් අවවාද මැනවින් පිළිගත්තේය.

● මිගාර සිටුවරයාට ධර්මාවබෝධය ලැබීමට මග පෙන්වීය.

● පූර්වාරාමය හෙවත් මිගාරමාතා ප්‍රාසාදය සංඝ සතු කළේය.

● දන් දීමේ ඇලුණු උපාසිකාවන් අතර අග තනතුර ලැබීය.

● කුමාර කස්සප මාතාවගේ ගැටලුව විසඳීම විශාඛාවට පැවරුවිට එය ඉතා මැනවින් ඉටු කිරීමද ආදර්ශයකි.

● අන්‍යයන්ගේ සිත් දිනාගනිමින් වගකීම් හා යුතුකම් ඉටු කළ ආදර්ශ සම්පන්න චරිතයකි.

අවවාද පිළිපැදීම, තමා ඇසුරු කරන අය යහමගට ගැනීම ආදී වූ ආදර්ශ විශාඛාවගේ චරිතයෙන් අපට ලබාගත හැකිය.

03. (i) ● දෙවියන් වහන්සේ හා මිනිසුන් අතර අතර මැදියන් ලෙස කටයුතු කළේ පූජකවරුය.

● පූජකවරු සිව්දෙනෙක් ඉතා ප්‍රකටය.

1. හෝතෘ:- දෙවියන්ට යාගය පිණිස ආරාධනා කරන පූජකයා
2. උද්ගාතෘ:- දෙවියන් සතුටුවන ලෙස වේද පාඨ ගායනා කරන පූජකයා
3. අධ්වර්යු:- යාගයේ ප්‍රධාන පූජකයා
4. යඥාකාරක:- යාගය කරන පූජකවරයා

පූජකවරයා වේදය පිළිබඳ දැනඋගතුන් කෙනෙකි. පූජකවරයකුගේ සහභාගිත්වය නැති යාගය දෙවියන් නොපිළිගන්නා බව සඳහන් කළේය.

(ii) ● නිශ්චිත අරමුණක් කරා අනුගාමිකයන් මෙහෙයවන්නා හික්මවන්නා නායකයාය.

● බුදුරදුන්ගේ නායකත්ව ලක්ෂණ, අන්තගාමී නොවීම, මැදහත් පිළිවෙත් අනුගමනය, දේශනා, කෞශල්‍ය උපාය කෞශල්‍ය ඥානය, මහා කරුණාව මහාප්‍රඥාව ආගමික සහනසීලි බව යනාදි කරුණු තුළින් ප්‍රකට වෙයි.

● ප්‍රථම ධර්මදූත සේවාව සඳහා උපදෙස් දී (චරථ භික්ඛවේ චාරිකං ...) තමන් වහන්සේ ද ධර්ම ප්‍රචාරයේ නියැලීම.

● සුදුසුසාට සුදුසු තැන ලබා දෙමින් තනතුරු පිරිනැමීම

● යථාවාදී තථාකාරී ගුණය අගයමින් කළගුණ සැලකීම, ගිලානෝපස්ථානය ආදිය සිදු කිරීම

● සිතීමේ හා විමසීමේ නිදහස ලබාදීම වැනි කරුණු ඇතුළත් කරමින් සපයා ඇති පිළිතුරු සඳහා සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

(iii) ● පරදුක්ඛෙසති සාධූනං හදයකම්පනංකරෝති, ති කරුණා අනුන්ගේ දුකෙහිදී සත්පුරුෂයන්ගේ හදවතේ ඇතිවන කම්පනය කරුණාවයි.

● බුදුවරයකු තුළ පිහිටන්නේ මහා කරුණාවයි.

●බුදුරදුන් දිනචරියාව ආරම්භ කළේ මහා කරුණා සමාපත්තියෙනි.

●සුනීත සෝපාල රජ්ජුමාලා, කිසාගෝතමී මට්ටකුණ්ඩලී පූතිගත්තතිස්ස තෙරුන්, හඳවතිකා ඇතින්න ආදී කතා පුවත් තුනක් නිදසුන් ලෙස ගෙන ඒවා කෙටියෙන් විස්තර කර ඇති පිළිතුරු සඳහා ප්‍රමාණවත් ලකුණු ලබා දෙන්න.

(iv) භෝග විනාශ මුඛ හයක් සිඟාලෝවාද සූත්‍රයේ දක්වේ.

1. මත්වතුර (සුරා) පානයෙහි යෙදීම
2. නොකල්හි වීථි සංචාරය කිරීම
3. උත්සව දර්ශනාදියෙහි ලොල් වීම
4. පාපී මිතුරන් ආශ්‍රය කිරීම
5. දූ කෙළියෙහි යෙදීම
6. අලසකම මේවා කෙටියෙන් හඳුන්වා තිබීම ප්‍රමාණවත් වේ.

(v) ●අල්පේච්ඡතාව යනු බලාපොරොත්තු අඩු බවයි

●ලද පමණින් සතුටු වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, කටයුතු බහුල නොවීම, සැහැල්ලු දිවි පෙවතක් ගත කිරීම ඉන්ද්‍රිය සංවරය ආදී ලක්ෂණ අල්පේච්ඡතාවය තුළින් අර්ථවත් වෙයි.

●බොහෝ සැපසම්පත් අපේක්ෂා කිරීම, අධික පරිභෝජනයට යොමු වීම වැනි කරුණු නිසා විවිධ ගැටලු පැන නගී. පුද්ගල පරිහානිය මෙන්ම සමාජ පරිහානියට ද ඒවා හේතු වෙයි. අල්පේච්ඡතාවයට යොමු වීමෙන් ඒවා පාලනය කර ගත හැකිය.

●බොහෝ ප්‍රශ්න මතුවන්නේ මහිච්ඡතාවය හෙවත් බලාපොරොත්තු වැඩි වීම හේතුවෙන බැවින් සමාජ ප්‍රශ්න හා පුද්ගල පරිහානිය වළක්වා ගැනීමට අල්පේච්ඡතාවෙන් කටයුතු කිරීම වැදගත් වන අයුරු දක්වා ඇති පිළිතුරට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

## II කොටස

04. (i) ●දී. නි. අග්ගඤ්ඤ සූත්‍රයේ දක්වෙන පරිදි "මහා සම්මත" පත් කර ගැනීම පිළිබඳව කරුණු දක්වා එය ප්‍රජාතන්ත්‍රවාදීව පත් කරගත් ආකාරය සඳහන් කළ යුතුය.

ජනතාවගේ අවශ්‍යතා සඳහා ජනහිතකාමී පාලකයකු මේ අනුව පත් වූ බව දක්විය යුතුයි.

(ii) ●ජීව විද්‍යාත්මක සාධකය වාසෙට්ඨ සූත්‍රය පදනම් කරගෙන ඉදිරිපත් කිරීම. (ජීවීන්ගේ විවිධත්වය හා මනුෂ්‍යයන්ගේ ඒකත්වය)

●සමාජ විද්‍යාත්මක සාධක සමාජ පරිනාමයේදී ආර්යයන් දාසයන්වීම, දාසයන් ආර්යයන් වීම වැනි සාධක අස්සලා යන සූත්‍රය ඇසුරෙන්.

●ඓතිහාසික සාධක (නොකිළිටි පරම්පරා) පාරිශුද්ධියක් නැති බව (අම්බට්ඨ සූත්‍රය ඇසුරෙන්)

●ආචාර විද්‍යාත්මක සාධක (උපතින් කෙනෙකු උස් පහත් නොවන බව) වසල සූත්‍රය ඇසුරෙන්

●ආර්ථික විද්‍යාත්මක නීති විද්‍යාත්මක ආදී ලෙන් සාධක තුනක් පැහැදිලි කිරීම ප්‍රමාණවත් ය.

05. (i) ●නිගණ්ඨ:- තමන් කෙලෙස් ගැටවලින් තොරයැයි කියා සිටි සාධුවරුන් නිගණ්ඨ නමින් හැඳින් වූ අතර ශ්වේතාම්බර හා දිගාම්බර ලෙස ඔවුන්ගේ කණ්ඩායම් දෙකක් විය. දුෂ්කර ව්‍රත අනුගමනය කළ පිරිසකි.

ආජීවක:- දණ්ඩක් අතදරා සිටි අත්තකිලමථානුයෝගීව සිටිමින් උග්‍ර තපස් ව්‍රත අනුගමනය කළ පිරිසකි.

ජටිල:-හිසෙහි ජටා දරා සිටියේය. සමහරු සංචාරක ජීවිත ගත කළ අතර ඇතැම් ජටිලයෝ ආරාමවල ජීවත් වෙමින් ගිනි දෙවියන් පිදීමටත් උදකපාරිශුද්ධියටත් යොමු වී සිටි බව සඳහන් වේ.

පරිබ්‍රාජක:- අත්තකිලමථානු යෝගය අනුගමනය කරමින් දුෂ්කර ව්‍රත අනුගමනය කළ පිරිසකි.

(ii) ●සන්සුන් ඉඳුරන් ඇති පිරිසකි. සිලාදි ගුණ ධර්මයන්ගෙන් පිරිපුන් කසාවත් අඳින පිරිසකි. සන්සුන්ව ගමන් කරන පිරිසකි.

●සරල දිවි පැවැත්මක් ඇති පිණ්ඩපාතයෙන් යැපෙන පිරිසකි.

●අටලෝ දහමින් කම්පා නොවන මධ්‍යම ප්‍රතිපදාවන් අනුගමනය කරන පිරිසකි.

●වර්තමානයෙන් යැපෙන අනාගතය හා අතීතය පිළිබඳ ශෝක නො උපදවන පිරිසකි.

●ප්‍රසන්න වූ ශ්‍රමණ පිරිසකි

●කායික වාචසික මානසික පවිත්‍ර බව ඇත.

●අභ්‍යන්තර බාහිර පිරිසිදු බව ඇත.

●නිවණ අරමුණු කරගෙන ප්‍රතිපත්ති රකියි. ආදී කරුණු ඇතුළත් පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න.

06. (i) ●රජුගේ සහභාගිත්වයෙන් වප් මඟුල්උත්සවය පැවැත්වූ බව. (වප් මඟුල් දිනයේ සිදුහත් කුමරු දඹරුක් සෙවනෙහි ආනාපානසති භාවනාව වැඩීම)

●කෘෂි කර්මාන්තයට අදාළව බත යන අර්ථය ඇතිව.... යන්න රජවරුන්ගේ නම්වලට යොදා තිබීම. උදා:- සුද්ධෝදන, අමිතෝදන, මිතෝදන, ධෝතෝදන

●කසීභාරද්වාජ සූත්‍රයේදී කෘෂි උපකරණ උපමා ලෙස යොදා ගනිමින් දහම් දෙසීම හා බමුණන් ද කෘෂිකර්මාන්තයේ යෙදීම.

●මගධ කෙත් යාය අනුව සිවුරු සකස් කර ගැනීමට භික්ෂූන්ට උපදෙස් ලබා දීම.

●කෘෂිකාර්මික කටයුතු සඳහා සංවිධානය කළ වාරිමාර්ග පද්ධති පැවතීම.

●ගොවිතැන් කටයුතු සඳහා ජලය බෙදා ගැනීමට ශාක්‍ය කෝලිය වංශවතුන් යුද වැදීම...

වැනි කරුණු පහක් ඇති පිළිතුරු සඳහා සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ii) ●පාරිභෝගික භාණ්ඩ හුවමාරු ක්‍රමය වෙනස් වී මුදල් (කහවනු) භාවිතයට යොමුවීම.

●චීනයේ සිට අරාබිය දක්වා භාරතය හරහා වැටී තිබුණු සේද මාර්ගය නිසා ජාත්‍යන්තර සම්බන්ධතා ඇතිවීම.

●යුද්ධකර අල්ලාගත් ප්‍රදේශ ආශ්‍රිතව නව නගර බිහිවීම.

●කාසි භාවිතය නිසා බැංකු පොලී මධ්‍යස්ථාන බිහිවීම

●කසී සළු නිෂ්පාදන, පේෂ කර්මාන්ත හා සුවඳ විලවුන් නිෂ්පාදනය කිරීම

●සිටුවරු නමින් නව ධනපති පන්තියක් බිහිවීම

●ගමේ සිටුවරයා නගරයේ සිටුවරයා සමග සබඳතා පැවැත්වීම.

●විනෝදාස්වාද සැණකෙළි පැවැත්වීම

●සුරාසැල්, ගණිකාවෘත්තිය සම්භාහන මධ්‍යස්ථාන බිහිවීම ... ආදී කරුණු ඇතුළත් විය යුතුයි.

07. (i) ●දානය, සීලය, පරිත්‍යාගය, ඍජුබය, මෘදු බව, තපස, අක්‍රෝධය (ක්‍රෝධ නොකිරීම) අවිහිංසාව, ඉවසීම, විරුද්ධ නොවීම, යන රාජධර්ම දහය නම්කර ඒවා පාලකයන් අනුගමනය කිරීමෙන් යහපත් පාලන ක්‍රමයක් සකස් වන ආකාරය පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

(ii) ●කූට දන්ත සූත්‍රයට අනුව සාර්ථක රාජ්‍ය පාලකයකු සඳහා අවශ්‍ය සුදුසුකම් මාලාවක් දක්වා ඇත.

1. මවුපිය දෙපයින් අභිජාත පිළිගත් පුද්ගලයකු වීම
2. ධන ධාන්‍ය ඇති ඉසුරුමත් පුද්ගලයකු වීම
3. මහා දන උගත් කමකින් යුක්තවීම
4. ප්‍රසාද එළවනසුළු තැනැත්තකුවීම
5. සිල්වත්වීම
6. යහපත් තෙපුල් ඇත්තකුවීම
7. බලවත් වූ අණ පිළිපදින සිවුරඟ සෙනඟක් ඇත්තකුවීම
8. ශ්‍රද්ධාවන්ත දානපතියකුවීම
9. නුවනැත්තකු හා උගතකු වීම
10. පාලකයා සිය රාජ්‍ය තුළ අපරාධ වළක්වා ආර්ථික සංවර්ධනය ඇති කිරීමට ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

08. (i) ●කෘෂිකර්මාන්තය, පශුපාලනය, දැහැමි වෙළඳාම, කම්කරු රාජ්‍ය සේවය වැනි රැකියාවල නිරතවීම

●වණිජ්ජ සූත්‍රයේ සඳහන් සත්ත වණිජ්ජා

සත්ථ වණිජ්ජා
මච්ච වණිජ්ජා
මජ්ජ වණිජ්ජා
විස වණිජ්ජා යන

අදැහැමි වෙළඳාම්වලින් වෙන්වීම

●තුලාකූට කංසකූට මානකූට නිකති උක්කෝටන යන වංචනික උපක්‍රමවලින් වෙන්වීම

●පත්තකම්ම සූත්‍රයේ දැක්වෙන පරිදි

●දහඩිය මහන්සියෙන් ධනය උපයා ගනිමින් (උට්ඨාන විරියාධිගතේහි බාහා බල පරිචිතේහි සේදා වක්ඛිත්තේහි ධම්මිකේහි ධම්ම ලද්දේහි

●වේයා තුඹස බඳින්නා සේ (වම්මිකොවුපචීයති) රොන්ගන්නාසේ (බමරසේව ඉරියතෝ) ධනය උපයා ගත යුතු බව වැනි කරුණු පදනම් කරගෙන පිළිතුර සකස් විය යුතුය.

(ii) ●සිඟාලෝවාද සූත්‍රයේ ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය ආදී ලෙස ආදායම කොටස් 4කට බෙදා පරිහරණය කළ යුතු ආකාරය

● ධනය නිසි ලෙස පරිහරණය කිරීම සැපයක් බව (භෝග සුඛය) අණන සූත්‍රය)

●ධනය පරිහරණය කිරීමටත් දීමටත් බව. ධනය නිසි පරිදි පරිහරණය නොකරනඅසත් පුරුෂයා අතට පත් ධනය සිහිල් දිය පිරුණු පස්පියුමෙන් සැදි රකුසෙක් අරක්ගත් විලක් වැනිය. සත්පුරුෂයා අතට පත් ධනය පස්පියුමෙන් සැදි සිහිල්දිය ඇති රකුසකු අරක් නොගත් විලක් වැනිය. (අපුත්තක සූත්‍රය)

●දැහැමින් ලැබූ ධනය පංචබලි සඳහා යෙදවිය යුතුයි.

(ඤාති බලි, අතිථි බලි, රාජ බලි, පුබ්බ පේත බලි, දේවත බලි)

●තමාගේත් අනුන්ගේත් ප්‍රයෝජනය සඳහා ධනය යෙදවිය යුතුයි

●ධනය ගොඩගසා ගත යුත්තක් නොව සංසරණය විය යුත්තකි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය තෙවන වාර පරීක්ෂණය, 2018 ජූලි
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 ஜூலை, தரம் 12 மூன்றாம் தவணைப் பரீட்சை
**General Certificate of Education (Adv. Level), Grade 12 Third Term Test, 2018 July**

දේශපාලන විද්‍යාව
පිළිතුරු පත්‍රය
**Political Science**

**23** **S** **I-II**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01 - 3 | 11 - 3 | 21 - 1 | 31 - 2 | 41 - 3 |
| 02 - 1 | 12 - 5 | 22 - 3 | 32 - 3 | 42 - 1 |
| 03 - 1 | 13 - 5 | 23 - 4 | 33 - 5 | 43 - 1 |
| 04 - 1 | 14 - 4 | 24 - 4 | 34 - 2 | 44 - 3 |
| 05 - 3 | 15 - 1 | 25 - 5 | 35 - 4 | 45 - 1 |
| 06 - 2 | 16 - 2 | 26 - 1 | 36 - 1 | 46 - 5 |
| 07 - 3 | 17 - 4 | 27 - ඕනෑම පිළිතුරක් | 37 - 1 | 47 - 1 |
| 08 - 2 | 18 - 5 | 28 - 4 | 38 - 3 | 48 - 1 |
| 09 - 3 | 19 - 4 | 29 - 3 | 39 - 5 | 49 - 2 |
| 10 - 4 | 20 - 5 | 30 - 4 | 40 - 2 | 50 - 3 |

මුළු ලකුණු 2 × 50 = 100

## A කොටස කෙටි පිළිතුරු

01. 1. දේශපාලඥයින්
    2. දේශපාලන පක්ෂ

02. 1. ප්ලේටෝ
    2. ඇරිස්ටෝටල්

03. 1. දාර්ශනික/ප්‍රතිමානීය ප්‍රවේශය
    2. තුලනාත්මක ප්‍රවේශය
    - බහු විෂයක ප්‍රවේශය
    - ස්ත්‍රීවාදී ප්‍රවේශය
    - චර්යාවාදී ප්‍රවේශය
    - සමාජ විද්‍යාත්මක ප්‍රවේශය

04. 1. මැකියාවලී
    2. තෝමස් හොබ්ස්
    - කාල් මාක්ස්
    - හේගල්

05. 1. දේශපාලනය - ඇරිස්ටෝටල්
    2. කුමාරයා - නිකලෝ මැකියාවලී

06. 1. ලිබරල්වාදය
    2. සමාජවාදය
    - ෆැසිස්ට්වාදය

07. 1. රාජ්‍ය
    2. ආණ්ඩුව

08. 1. ඒකීය රාජ්‍ය
    2. සංධීය ආණ්ඩු - ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආණ්ඩු
       ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු

09. 1. නායකයින් පුහුණු කිරීම
    2. විසිරී ඇති මහජන මතය ඒකරාශී කිරීම

10. 1. අභිලාෂ කණ්ඩායම්
    2. ලොබි කණ්ඩායම්

11. 1. ආගමික ව්‍යාපාර
    2. වෘත්තීය සමිති ව්‍යාපාර
    - ස්ත්‍රී ව්‍යාපාර
    - තරුණ ව්‍යාපාර
    - ගොවි ව්‍යාපාර

12. 1. අභ්‍යන්තර ස්වාධිපත්‍යය
    2. බාහිර ස්වාධිපත්‍යය

13. 1. අධිකරණයේ ස්වාධීනත්වය
    2. මහජන ස්වාධිපත්‍ය
    - නිදහස් හා සාධාරණ මැතිවරණ
    - වගකීම් සහිත ආණ්ඩුව

14. 1. තෝමස් හොබ්ස්
    2. ජෝන් ලොක්
    - ජීන් ජැක්විස් රූසෝ

15. 1. ලිබරල්වාදී ගුරුකුලය
    2. මාක්ස්වාදී ගුරුකුලය
    - රැඩිකල් ගුරුකුලය

16. 1. භූගෝලීය පිහිටීම
    2. ආරක්ෂාව
    - කීර්තිය
    - විවිධත්වය තුළින් ඒකීයත්වය ළඟා කර ගැනීමට

17. 1. ජනාධිපති ආණ්ඩු ක්‍රමය
    2. පාර්ලිමේන්තු (කැබිනට්) ආණ්ඩුක්‍රමය

18. 1. ජීවිත විනාශ වීම
    2. දේපළ විනාශ වීම

19. 1. සරල වර්ගීකරණය
    2. කෘත්‍යවාදී වර්ගීකරණය
    - දේශපාලන වර්ගීකරණය

20. 1. සහමන්ත්‍රණය
    2. මැදිහත්කරණය
    - සාම ගිවිසුම්
    - සාමය ගොඩනැගීම